**ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2020**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1. තත්ත්වාගණනය කළ මතය

------------------------------

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලයේ ("සම්මේලනය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් පාලන ආයතන 06ක ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා සම්මේලනය විසින් 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා එම පළාත් පාලන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණි. ජාත්‍යන්තර හා පාපන්දු සම්මේලනය විසින් ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් එකතුව රු. 137,994,358 ක මුදලක් වැය කර සිදුකර ඇති අතර, එම පිරිවැය 2009 වර්ෂයේදී සම්මේලනයේ කල්බදු වත්කම් සහ විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණද, ඒ සඳහා නීත්‍යානුකූල හිමිකමක් නොවීය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කර නොතිබුණි. | පොදු ව්‍යාපාර කාරක සභාවේදී 2019 වර්ෂය තළ විගණන නිරීක්ෂණයන් හි වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබූ පරිදි මෙම කරුන සම්බන්ධයෙන් සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදුකර වැරදි නිවැරදි කිරීම සඳහා උචිත විසඳුම් ලබාදීමට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් 2021 ඔක්තෝබර් 13 දින වෘත්තීය උපදේශන සමාගමක් වන "මුවර් කන්සල්ටින් (පෞද්.) සමාගම" පත් කර ඇත. මෙම ඇගයීම අවසන් කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර මෙම ගැටලුව විසඳීමට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය අදහස් කරයි. | මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ පහකට වැඩි කාලයක සිට හිඟව පැවති රු. 11,581,538 ක් වූ ලැබිය යුතු ශේෂයන් හයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් පාර්ශවකරුවන් ගණනාවක් වෙතින් ලැබිය යුතු හිඟ ශේෂයන් අයකර ගැනීමට/ පියවීමට විවිධ පියවර අනුගමනය කරමින් සිටින අතර, එම ක්‍රියාවලිය 2021 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර අවසන් කිරීමට අපේක්ෂා කරයි. | දිගුකාලීනව ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පෙර වර්ෂ ද ඇතුළත්ව 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවිධායකයන් වෙත ලබාදී ඇති අත්තිකාරම් වල මුළු වටිනාකම රු. 609,898 කි. නමුත්, අත්තිකාරම් ආපසු අයකරගැනීමට සම්මේලනය විසින් කටයුතු කර නොතිබුණි. එමෙන්ම, ලබාදිය යුතු අත්තිකාරම් මුදලේ උපරිම අගය තීරණය කර නොතිබූ අතර, අපේක්ෂිත කාර්යයන් අවසන් වීමෙන් පසුවද නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් තහවුරු කළ හැකි සාක්ෂි රැස්කරන අතර, මෙම ගැටලුව විසඳීම සඳහා තොරතුරු රැස්කරනු ලැබේ. | නියමිත කාර්යයන් අවසන් වූ වහාම අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.171,793,729ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.205,083,615 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,289,886 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු. 44,458,528 කින් අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු මූල්‍ය කළමනාකරු විසින් තරඟාවලි විනිසුරුවරුන්ගේ ව්‍යාජ නම් මුදල් ගෙවීම් ලේඛනවලට ඇතුළත් කර වංචනික ලෙස මුදල් ලබාගෙන ඇති බවට 2017 වර්ෂයේදී සම්මේලනය විසින් සිදුකළ විමර්ෂණ වලදී අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධයෙන් පෞද්ගලික විගණන ආයතනයක් විසින් සිදුකර ලද විගණනයට අනුව එය රු. 48,388,399 ක වංචාවකි. කෙසේ වෙතත්, 2021 නෙවැම්බර් මාසය අවසන් වන විටද මෙම පාඩුව අයකර ගැනීමට සම්මේලනය අපොහොසත් වී තිබුණි. | පොදු ව්‍යාපාර කාරක සභාවේදී 2019 වර්ෂය තළ විගණන නිරීක්ෂණයන් හි වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබූ පරිදි ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ හිටපු සභාපතිවරයා විසින් රු. 48,388,399 ක වංචා සහගත මුදල අයකර ගැනීම සඳහා හිටපු මූල්‍ය කළමනාකරුට එරෙහිව අපරාධ පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත 2020 සැප්තැම්බර් 15 දින පැමිණිල්ලක් ගොනු කර ඇත. | එම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 වගන්තියට අනුව, 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2021 අගෝස්තු 03 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කළ පරිදි ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් අපගේම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමින් පවතී. මෙය 2022 වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එතෙක් දැනට පවතින ප්‍රසම්පාදන ක්‍රමවේදයන් ක්‍රියාක්මක කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |